# ග්‍රාමීය ණය හා මෑත කාලීන වෙනස්කම්


*එස්. ආර්. බණ්ඩාර*

*පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරිනී*

*ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය*


ශ්‍රී ලංකාවේ ජනගහණය වර්ධනය වීමත් හා සමගම ග්‍රාමීය නිෂ්පාදන කටයුතුවල කාර්යභාරය දේශීය ඉල්ලුම සපුරාලන වෙළඳමය ආර්ථිකයක් කරා හැඩ ගැස් වීමේ අරමුණු සහිත ආර්ථික ප්‍රතිපත්ති කෙරෙහි යොමුවීය. ඒවායේ ප්‍රතිඵල වශයෙන් ගැමි ජනතාවගේ යැපීම් මට්ටමේ වූ ආර්ථික කටයුතු එම රාමුවෙන් පිටතට ගෙන දේශීය වෙළඳ පොල ඉල්ලුම සපුරාලන ආර්ථිකයක් බවට පත් කර වීමට යොමු කරවා තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රාමීය ජනතාව තම නිෂ්පාදන නිමි වලලු පුළුල් කිරීමේ අරමුණු ඉටු කර ගැනීමේ කටයුතුවල නිරත වී සිටියි. එබැවින් ඒ සඳහා අවශ්‍ය කරන නිෂ්පාදන සම්පත් සඳහා ඉල්ලුම වැඩිවෙමින් පවතී.

ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය මුළුමනින්ම වාගේ කෘෂි කර්මාන්තය මත රැඳී පවත්නා අතර, ඉතා සුළු ප්‍රමාණයක්, ග්‍රාමීය හා ලුහු කර්මාන්ත මත රැඳී පවතී. දේශීය වෙළඳ පොල ඉල්ලුම සපුරාලීමේ ජාතික මෙහෙවර ඉටු කර ලීමට නම් පවත්නා නිෂ්පාදන ධාරිතාවය පුළුල් කළ යුතු වේ. ඒ සඳහා පරිමාණය ඉහළ නැංවීමෙන් හෝ නිෂ්පාදන මට්ටම් ඉහළ නැංවීමෙන් හෝ නිමැවුම් ප්‍රමාණය වැඩි කළ යුතුවේ. නිමැවුම් ප්‍රමාණය වැඩි කිරීම සඳහා තවත් අමතර යෙදවුම් ප්‍රමාණයක් නිෂ්පාදන ක්‍රියාවලියට ඇතුළත් කර ගැනීම අත්‍යවශ්‍ය වේ. එම යෙදවුම් භූමිය ශ්‍රමය ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය සහ ශිල්පීයමය දැනුම යන ඒවා හෝ ඒ සමග සම්බන්ධ ඒවා හෝ වන අතර ඒ සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදුවේ. එම පිරිවැය දැරීම සඳහා අරමුදල් අවශ්‍යවේ. ඒ සඳහා ප්‍රථමයෙන් ම තම තමන්ගේ ඉතිරි කිරීම් දෙසට යොමු වන අතර, තමන්ගේ ඉතිරිකිරීම් නැත්නම් හිත මිතුරන්ගෙන් අතමාරුවට ලබා ගැනීමට සිදුවේ. එසේත් නැත්නම් පොළියට මුදල් ලබා ගැනීමට සිදුවේ. ඇතැම් විට විපතකට හෝ යම් හානියකට මුහුණ පෑමට සිදුවුණි නම්, එම පාඩුව පිරවීම සඳහා ද ණය මුදල් ලබා ගැනීමට සිදු වේ. එමෙන්ම විපත් වලට පැමිණීම වැනි හදිසි අවස්ථාවලට මුහුණ දුන් විට පරිභෝජනය සඳහා ද ණය ගැනීමට සිදුවේ. මේ කවර හේතුවක් හෝ

J 60539

නිසා ණය ගැනීමේ අවශ්‍යතාවය උදව්ය හැකි අතර, පොළියට සපයන මූල්‍ය අරමුදල් සංචිත සඳහා ගැමි ජනතාවගේ මේ ඉල්ලුම ග්‍රාමීය ණය ඉල්ලුම වශයෙන් පොදුවේ හැඳින්වේ. පොළිය යනු එම අරමුදල් යම් කාල පරිච්ඡේදයක් තුළ පරිහරණය කිරීම සඳහා මුද හැරීම වෙනුවෙන් එය ලබා ගන්නා අය ගෙවනු ලබන මිල හෙවත් පිරිවැයයි.

තරඟකාරී වෙළඳ පොලක මූල්‍ය සම්පත් වල මිළ, ඉල්ලුම හා සැපයුම අනුව තීරණය වන බවට උපකල්පනය කරන අතර, මෙය මූල්‍ය වෙළඳ පොල යනුවෙන් හැඳින් වේ. ග්‍රාමීය ණය අරමුදල්වල සැපයුම කෙරෙහි මූල්‍ය වෙළඳ පොලේ තීරණය වන මිල යම් තරමකින් බලපෑම් ඇති කරයි. ණය අරමුදල් සැපයීම අසංවිධිත හා සංවිධිත යන දෙආකාරයකින් සිදු වේ.

අසංවිධිත ආකාරයට ණය අරමුදල් සැපයුම හා ඉල්ලුම සහ එහි පොළිය තීරණය කිරීම ඊට සහභාගි වන අයගේ පෞද්ගලිකත්ත්වය මත රැඳී පවතින අතර පෞද්ගලික අංශය විසින් එය පුද්ගලික ව්‍යාපාරයක් වශයෙන් කර ගෙන යනු ලබයි. ණය මුදල් ලබා දීමේ දී පොළී ප්‍රමාණය හා එය ලබා ගන්නා ආකාරය පිළිබඳව දැනුමක් දෙපැත්තේ ම තිබෙන අතර ණය මුදල් ලබා ගන්නා අය එම පොලී ප්‍රමාණයට හෝ කොන්දේසිවලට එකඟ නොවන්නේ නම් එම ගනු දෙනුව සිදු වන්නේ නැත. පොළිය හා කොන්දේසි පිළිබඳව සාකච්ඡා කර ඒවායේ බර අඩු කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා බොහෝ විට දුර්ලභය. මූල්‍ය සංචිත හිමියාගේ ආධිපත්‍යයට අනුකූලව ණය අරමුදල් ලබා ගත යුතු වන අතර එහි අසාධාරණත්වයෙන් ණය ගන්නා අය නිතරම පීඩාවට පත්වන සුළු වේ. ණය මුදල් ලබා ගන්නා අයගේ කටහඬ එහිදී හඬ නොනැගේ. ණය ඉල්ලුම්කරුගේ මූල්‍යමය ශක්‍යතාවයන් පිළිබඳව මුදල් හිමියා ස්වයං තක්සේරුවකට පැමිණෙන අතර ආපසු අය කර ගන්නා ආකාරය පිළිබඳව ද පෞද්ගලිකව දන්නා තොරතුරු මත යම් ක්‍රමයක් සකස් කර ගනී. ඇතැම් විට එය නිම් භාණ්ඩ ලබා ගැනීමෙන් ණය ගෙවී යන ආකාරයට සකස් වූ ක්‍රමයක් විය හැකිය. එය එම ගනු දෙනුවට සම්බන්ධ වන දෙපක්ෂයේ තීරණයක් වේ.

සංවිධිත ආකාරයේ ග්‍රාමීය ණය යම් ආකාරයක සංවිධානාත්මක ස්වරූපයකින් යුක්ත වන අතර එය රජයේ වාණිජ බැංකු මගින් කරගෙන යනු ලැබේ. රජයේ අනු දැනුම ඇතිව රාජ්‍ය අනුග්‍රහය යටතේ නියමිත කොන්දේසි මාලාවක් අනුව රජයේ වාණිජ බැංකු වන, ලංකා බැංකුව, මහජන බැංකුව හා ලෝක බැංකු උපදෙස් යටතේ සුළු හා මධ්‍ය පරිමාණ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා රජය පිළිගත් හැටන් නැෂනල් බැංකුව යන බැංකු මගින් හා ග්‍රාමීය බැංකු මගින් ක්‍රියාත්මක කරගෙන යන කෘෂිකාර්මික ණය, වගා ණය හා ග්‍රාමීය පාරිභෝජන ණය වැනි සුළු පරිමාණ ණය යෝජනා ක්‍රම ග්‍රාමීය ණය වශයෙන් පිළිගැනේ.

මේ සඳහා බැංකුව අවශ්‍ය කරන ලිපි ලේඛණ පිළියෙල කර තිබෙන අතර, ණය ඉල්ලුම් කරන අය එම ලිපි ලේඛණ පුරවා එය ඇප කරුවන් පිළිබඳ විස්තර ද සමග ඉදිරිපත් කළ යුතුවේ. එම ලිපි ලේඛණවල කොන්දේසි මාලාව ඇතුළත් වී ඇති අතර, එය පෞද්ගලික අංශයේ අසංවිධිත ආකාරයේ ණය දීම්වල දී මෙන් නොව ණය ලබා ගන්නා අයට ඇති වන අසාධාරණ පීඩනය ඉතාමත් සුළු ප්‍රමාණයක් වන පරිදි සකස් කර ඇත.

ඉල්ලුම්කරු තමා එම ණය ලැබීමට සුදුසු පුද්ගලයෙකු බව බැංකුවට ඔප්පු කිරීම සඳහා ඒ අවශ්‍ය ලිපි ලේඛණ ඉදිරිපත් කළ යුතු වේ. එමෙන්ම එම ලිපි ලේඛණ තම අත්සනින් යුතුව බැංකුවට බාර දීමෙන් බැංකුව ඉදිරිපත් කර තිබෙන කොන්දේසි මාලාවට එකඟ වන බව ද ප්‍රකාශ කර සිටියි.

ග්‍රාමීය අංශයට ණය පහසුකම් ලබා දීම පිළිබඳව රාජ්‍ය වාණිජ බැංකු අතුරෙන් මහජන බැංකුව සිය විශේෂ අවධානය යොමු කරයි. මෙතෙක් බොහොමයක් ග්‍රාමීය ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කර තිබෙන්නේ මහජන බැංකුව හරහා බැවින් අනෙක් බැංකුවලට වඩා මහජන බැංකුව මේ පිළිබඳව විශේෂත්වයක් දරයි. මහ බැංකුවෙන් අනුමැතිය ලත් ග්‍රාමීය ණය යෝජනා ක්‍රමවල නම් පහත දැක්වේ :

1. පොල් පොහොර ණය යෝජනා ක්‍රමය.
2. ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල කුඩා තේ වතු හිමියන් සඳහා වූ පොහොර සඳහා ණය යෝජනා ක්‍රමය.
3. මාතලේ – පුත්තලම දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වූ ණය යෝජනා ක්‍රමය.
4. බදුල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වූ ණය යෝජනා ක්‍රමය.
5. ධීවර අංශයට බැංකු මූල්‍ය සැපයීම් යෝජනා ක්‍රමය.
6. ධීවරයින්ගේ සමුපකාර සමිති සඳහා වූ ණය යෝජනා ක්‍රමය.
7. මාදැල් සඳහා ධීවර ණය යෝජනා ක්‍රමය.
8. ගවපට්ටි සංවර්ධනය සඳහා ණය යෝජනා ක්‍රමය.
9. ආසියානු සංවර්ධන බැංකුවේ හා ශ්‍රී ලංකාවේ සත්ව නිෂ්පාදන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ණය යෝජනා ක්‍රමය.
10. ආසියානු සංවර්ධන බැංකුව – ශ්‍රී ලංකා ග්‍රාමීය ණය ව්‍යාපෘතිය.
11. ආසියානු සංවර්ධන බැංකුව – ශ්‍රී ලංකා පොල් සංවර්ධන ව්‍යාපෘතිය.
12. මුළු දිවයිනටම බලපාන ගොවිපල් යාන්ත්‍රිකරණය සඳහා ණය යෝජනා ක්‍රමය.
13. මාතර දිස්ත්‍රික්කයේ ස්වයං රැකියා වැඩ සටහන් යටතේ ව්‍යාපෘති වලට මූල්‍ය සැපයීමේ ණය යෝජනා ක්‍රමය.
14. අනුරාධපුර දිස්ත්‍රික්කයේ – එම –
15. කළුතර හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ – එම –
16. නුවර, කෑගල්ල හා මාතලේ සහ එම දිස්ත්‍රික්කවල ස්වයං රැකියා සහ වෙනත් මූල්‍ය පහසුකම් සැපයීමේ යෝජනා ක්‍රමය.
17. අනුරාධපුර වියළි කලාපීය ව්‍යාපෘතිය.
18. සෙවනගල, හිඟුරාන හා කන්තලේ උක් වගා ව්‍යාපෘතිය යටතේ උක් වගාව සඳහා සුළු ගොවීන්ට ණය සහන සැපයීමේ යෝජනා ක්‍රමය.
19. පැලවත්ත උක් වගා ව්‍යාපෘතියත් සඳහා ණය යෝජනා ක්‍රමය.
20. කුරුණෑගල දිස්ත්‍රික්කයේ...... ඉඟුරු, අන්නාසි හා වැල් දොඩම් වගාව සඳහා ණය යෝජනා ක්‍රමය.
21. ලෝක ආ. කෘ. සංවිධානය හා කාන්තා කාර්යාංශය යටතේ වතු කාන්තාවන්ගේ ආදායම් ඉපයීමේ ව්‍යාපෘතිවලට ආධාර කිරීමේ ණය යෝජනා ක්‍රමය.
22. උස්සාන වාරිමාර්ග සඳහා නළ ළිං තැනීම සඳහා ණය යෝජනා ක්‍රමය.
23. කෘෂි කාර්මික ණය යෝජනා ක්‍රමය.
24. පාරිභෝජන ණය යෝජනා ක්‍රමය.

(ඉතිරි කොටස ලබන කලාපයේ පළ වේ.)